COMMUNICATION & MEDIA UNIT
UNIVERSITY OF KELANIYA – SRI LANKA
සන්නිවේදන හා මාධ්‍ය ඒකකය
කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ඔබේ අංකය :
YOUR NO :
මගේ අංකය :
MY NO :

T.P. 011-2908016
FAX 011-2908016

# කැලණිය විශ්වවිද්‍යාලය විසින් හඳුන්වා දෙන නව උපාධි පාඨමාලා සහ අභියෝගතා පරීක්ෂණ

2020 අ.පො.ස. උසස් පෙළ විභාගයට මුහුණ දුන් අපේක්ෂකයන්ට රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් පිරිනැමෙන පාඨමාලා සඳහා අයදුම් පත් කැඳවීම මේ වන විට විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇත. මෙම වසරේ පටන් කැලණිය විශ්වවිද්‍යාලය විසින් නව ගෞරව උපාධි පාඨමාලා පහක් ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව කටයුතු කරන විවිධ විද්වත් පාර්ශ්වයන්ගේ සහයෝගයෙන් විද්‍යා පීඨයේ, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ සහ වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සාමූහිකත්වයෙන් මෙම කාලෝචිත නව උපාධි පාඨමාලා පහ ආරම්භ කර ඇත. අදාළ ක්ෂේත්‍රයේ මූලධර්ම හා න්‍යායන් පිළිබඳව මනා අවබෝධයක් ලබා, එම අවබෝධය අනාගත වැඩ ලෝකයේදී ප්‍රායෝගිකව භාවිතා කිරීමේ නිපුණතාවයෙන් යුත් උපාධිධාරීන් පිරිසක් බිහිකිරීම මෙම නව උපාධි පාඨමාලාවන්හි මූලික අරමුණයි.

## විද්‍යා පීඨය මගින් ආරම්භ කරන පාඨමාලා

- කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය මගින් නව විද්‍යාවේදී ගෞරව උපාධි තුනක් හඳුන්වා දෙයි. ඒවා නම් විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව, විද්‍යාවේදී (ගෞරව) ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව සහ විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාවයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක් මගින් ව්‍යවහාරික රසායන විද්‍යාව සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති එකම සිව් අවුරුදු විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව මෙයයි. ශ්‍රී ලංකාවේ කාර්මික, කෘෂිකාර්මික, ආහාර සහ පාරිසරික අංශවල සේවා යෝජකයන්ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි විශ්ලේෂණය සහ රසායනික මත පදනම් වූ දැනුම සහ කුසලතා අත්පත් කරගැනීමට ශිෂ්‍යයන්ට මෙමගින් හැකි වනු ඇත. උසස් පෙළ රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව සමඟ ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණිතය, උසස් ගණිතය හෝ කෘෂි විද්‍යාව යන විෂයන්ගෙන් එකක් සමත් වූවන් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීම සඳහා පහත සඳහන් ලින්කුවට පිවිසෙන්න.

  https://science.kln.ac.lk/depts/chem/

- ඉලෙක්ට්‍රොනික සහ පරිගණක විද්‍යාව සම්බන්ධයෙන් න්‍යායාත්මක සහ ව්‍යවහාරික දැනුමකින් යුත් උපාධිධාරීන් බිහි කර ජාතික සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා දායකත්වය සපයා ගැනීම විද්‍යාවේදී (ගෞරව) ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පාඨමාලාවෙහි අරමුණ වේ. ශිෂ්‍යයන්ට මෘදුකාංග සහ දෘඩාංග යන තාක්ෂණ ද්විත්වයෙහිම නිපුණත්වය ලබා දීමේ අරමුණෙන් භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයන අංශයේ, සංඛ්‍යාන හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශයේ සහ ගණිත අධ්‍යයන අංශයේ සාමූහිකත්වයෙන් මෙම උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබීම සඳහා උසස් පෙළ විභාගයේදී භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය ඇතුළුව විෂයන් තුනම සමත්ව තිබිය යුතු අතර සංයුක්ත ගණිතය, උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට වැඩි සාමාර්ථයක් ලබා තිබිය යුතුය. එසේම රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, උසස් ගණිතය හෝ තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය යන ඒවායෙන් එකක් තෙවැනි විෂය ලෙස හදාරා තිබිය යුතුය. මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීම සඳහා පහත සඳහන් ලින්කුවට පිවිසෙන්න.

  https://science.kln.ac.lk/index.php/component/sppagebuilder/?view=page&id=40

- විද්‍යාත්මක දෘෂ්ටිකෝණයක් මත පදනම්ව ක්‍රීඩා, ව්‍යායාම, සෞඛ්‍යය සහ ආරක්ෂාව යන අංශවල ගැඹුරු සහ කාලීන දැනුමකින් යුතු උපාධිධාරීන් බිහි කිරීම විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යාව පාඨමාලාවෙහි අරමුණ වේ. උසස් පෙළ විභාගයේ ඕනෑම විෂයන් තුනක් සමත් වූ ශිෂ්‍යයන් හට මෙම පාඨමාලාව විවෘතය. කෙසේ නමුත් අයදුම්කරුවන් අභියෝගතා පරීක්ෂණය සමත් විය යුතු අතර ජාතික හෝ පළාත් මට්ටමේ ක්‍රීඩා කුසලතාවලට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. පාසල් කාලයේදී ක්‍රීඩාවට සමත්කම් දැක්වූ ශිෂ්‍යයන් සඳහා ක්‍රීඩාවට ඇති ඇල්මෙන් යුතුව එම ක්ෂේත්‍රයේම උපාධියක් ලබා වෘත්තීය අවස්ථා උදාකර දීමට මෙමගින් අවස්ථාව ලැබේ. යෝග්‍යතා පුහුණුව, පෝෂණය, තුවාල වැළැක්වීම, පුහුණුව ආදී ක්ෂේත්‍රයන්ගේ දැනුම ලබා ගැනීමට සහ ක්‍රීඩා විද්‍යාවේ ඇති කාර්ය සාධනය වැඩි දියුණු කරවන ක්‍රමෝපායන්ගේ නිපුණතාව ලබා ගැනීමට මෙම පාඨමාලාවෙන් උපාධිධාරීන්ට හැකි වනු ඇත. යහපැවැත්ම සඳහා නායකත්වය ගැනීමටත් අපගේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා අන්තර්ජාතික මට්ටමට ඔසවා තැබීමටත් මෙම පාඨමාලාව බලාපොරොත්තු වේ. මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීම සඳහා පහත සඳහන් ලින්කුවට පිවිසෙන්න.

  https://science.kln.ac.lk/tunits/sports/index.php

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් ආරම්භ කරන පාඨමාලා

- වාණිජ විෂය ධාරාවේ උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුමට ප්‍රතිචාරයක් වශයෙන් වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ සිව් අවුරුදු පාඨමාලාව හඳුන්වා දී ඇත. උසස් පෙළ විභාගයේදී ගිණුම්කරණය සහ ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර අධ්‍යයනය සහ ව්‍යාපාර සංඛ්‍යානය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමත් ශිෂ්‍යයන් හට මෙම පාඨමාලාවට අයදුම් කළ හැකිය. මෙය ගිණුම්කරණ විෂය තොරතුරු පද්ධති හා කළමනාකරණය යන කුසලතා සමඟ මුහු කරවන පාඨමාලාවකි. එසේම මෙම සුවිශේෂී උපාධි පාඨමාලාව කොළඹ වරාය නගර ව්‍යාපෘතිය වැනි ආයතනික අංශවල අවශ්‍යතා සැපිරීමට ද මනා ලෙස ඉවහල් වනු ඇත.

## වෛද්‍ය පීඨය මගින් ආරම්භ කරන පාඨමාලා

- වෛද්‍ය පීඨය විසින් සිව් අවුරුදු පාඨමාලාවක් ලෙස විද්‍යාවේදී (ගෞරව) වෘත්තීය චිකිත්සාව නමින් නව පාඨමාලාවක් හඳුන්වා දී ඇත. ශාරීරික හෝ මානසික ආබාධ ඇති ළමුන්ගේ සහ වැඩිහිටියන්ගේ දිගුකාලීන අවශ්‍යතාවලට සහයක් වීම මෙම වෘත්තියට ඇතුළත් වේ. වෘත්තීය චිකිත්සකවරු ආහාර කැවීම, ඇඳුම් ඇන්දවීම, මළ මුත්‍ර පහකරවීම සහ පිරිසිදු කිරීම වැනි දෛනික ක්‍රියා සඳහා සහය වෙති. වැඩිහිටියන් සිය වෘත්තිය තුළ යළි ස්ථාපිත කිරීම, විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා පාසල් පරිසරය සැකසීමට සහාය වීම වැනි ක්ෂේත්‍ර කෙරෙහි ඔවුහු සිය අවධානය යොමු කරති. උසස් පෙළ විභාගයේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයන් සමත් වූ ශිෂ්‍යයන්ට මෙම පාඨමාලාවට අයදුම් කළ හැකිය. මානව ජීව විද්‍යාව, ස්නායු විද්‍යාව, සංවර්ධන ස්නායු විද්‍යාව සහ මානසික සෞඛ්‍යය යන අංශ පිළිබඳව සායනික පුහුණුව සහ න්‍යායික පුහුණුව සහිතව ප්‍රජා සැකැස්මක ක්‍රියාත්මක වීම යනාදිය ද ඉගැන්වේ. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ප්‍රාමාණික දැනුමක් සහිත විදෙස් විද්වතුන් එක්ව සැකසූ විෂය මාලාවකින් සහිත පාඨමාලාවක් නිසා උපාධිධාරීන්ට මෙරට මෙන්ම විදේශ රටවල ද අනර්ඝ රැකියා අවස්ථා හිමි කර ගැනීමේ හැකියාව ඇත.

## විශේෂ පාඨමාලා සඳහා වන අභියෝගතා පරීක්ෂණ

නියම කර ඇති උසස් පෙළ විෂයන් සමත් වීමට අමතරව පහත සඳහන් පාඨමාලා සඳහා ඇතුළත් වීමට කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වන අභියෝගතා පරීක්ෂණවලට මුහුණ දීමට සිදු වනු ඇත.

- ශාස්ත්‍රවේදී (ගෞරව) සිනමා හා රූපවාහිනී අධ්‍යයනය
- ශාස්ත්‍රවේදී (ගෞරව) පරිවර්තන අධ්‍යයනය
- ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) මූල්‍ය ඉංජිනේරුකරණය
- විද්‍යාවේදී (ගෞරව) කථන හා ශ්‍රවණ විද්‍යාව
- විද්‍යාවේදී/ විද්‍යාවේදී (ගෞරව) කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය
- විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යාව

ඉහත සඳහන් පාඨමාලාවල සඳහා විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට අයදුම් කිරීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ (www.kln.ac.lk) ඇති ෆෝරම පත්‍රය පුරවා ප්‍රථමයෙන් අභියෝගතා පරීක්ෂණ සඳහා අයදුම් කළ යුතුය. 2021 ජුනි මස 18 වැනි දින තෙක් එලෙස මාර්ගගතව අයදුම් කළ හැකිය.